# අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා/ අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුරු සඳහා බඳවා ගැනීම (සීමිත) -2023**

අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ පවතින සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා තනතුරු 170 ක් සහ අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුරු 25 ක් සඳහා සීමිත පදනම මත සුදුස්සන් තෝරා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මඟින් **අධ්‍යක්ෂ,අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය,අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, නො19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10** යන ලිපිනයට දෙසැම්බර් මස 20 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ " **අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ පවතින සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා/ අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුරු සඳහා බඳවා ගැනීම**" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

සටහන- ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

## 01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය-

ලිඛිත පරීක්ෂණයේ සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණයෙන් හා යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණය යන දෙකෙන්ම ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පළමුව සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා තනතුරුවලටත්,ඉන් පසුව අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුරුවලටත් බඳවා ගනු ලැබේ.

## 02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි-

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
**සටහන** - විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට යටත් විය යුතුය.

( ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරියකු වසරක (වසර 01ක) වැඩ බැලීමේ කාලයකට යටත් වන අතර , වසර 03ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබාගත යුතුය.

(iv) සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

## 03.බඳවා ගැනීමේ ශ්‍රේණිය -111 වන ශ්‍රේණිය

## 04. වැටුප් පරිමාණය -

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 දරණ වැටුප් චක්‍රලේඛයට අනුව **PL-2-2016, රු.25,250-10X270-10X300-10 X 330-12 X 350- රු.38,450/-ක** (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. (2016/02/25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි II වන උප ලේඛනය පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

05 සුදුසුකම්-

(I) අධ්‍යාපන සුදුසුකම්:
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්වී තිබීම.

(II) පළපුරුද්ද:

<u>සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා තනතුර සඳහා :</u>

(I) සංචාරක අධිකරණ ආරක්ෂක/ අධිකරණ ආරක්ෂක, පිස්කල් පියන්,කම්කරු තනතුරක හෝ කම්කරු විනිශ්චය අධිකාරියක ආරක්ෂක තනතුරක හෝ මුරකරු තනතුරේ වසර 10 ක සේවා කාලයක් සපුරා තිබීම හා තනතුරේ ස්ථිර කර තිබීම.

හෝ

(II) කාර්යාල සේවක සේවයේ වසර 10 ක සේවා කාලයක් සපුරා තිබීම, තනතුරේ ස්ථිර කර තිබීම සහ අධිකරණ අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවක කම්කරු විනිශ්චය අධිකාරියක හෝ අධිකරණයක හෝ/ හා දැන්වීම ප්‍රසිද්ධ කරන දිනට වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

<u>අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුර සඳහා:</u>

(I) සංචාරක අධිකරණ ආරක්ෂක/ අධිකරණ ආරක්ෂක, පිස්කල් පියන්,කම්කරු තනතුරක හෝ කම්කරු විනිශ්චය අධිකාරියක ආරක්ෂක තනතුරක හෝ මුරකරු තනතුරේ වසර 10 ක සේවා කාලයක් සපුරා තිබීම හා තනතුරේ ස්ථිර කර තිබීම.

හෝ

(II) කාර්යාල සේවක සේවයේ වසර 10 ක සේවා කාලයක් සපුරා තිබීම, තනතුරේ ස්ථිර කර තිබීම සහ අධිකරණ අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවක කම්කරු විනිශ්චය අධිකාරියක හෝ අධිකරණයක හෝ/ හා දැන්වීම ප්‍රසිද්ධ කරන දිනට වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

(III) පිස්කල් භාරකාර මාතා තනතුරේ වසර 10 ක සේවා කාලයක් සපුරා තිබීම හා තනතුරේ ස්ථිර කර තිබීම.

**සටහන** - සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා තනතුර සඳහා පිරිමි අයදුම්කරුවන්ද අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුර සඳහා කාන්තා සහ පිරිමි අයදුම්කරුවන්ද බඳවා ගැනේ.

**06.වයස් සීමාව** - අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 නොඅඩු විය යුතු අතර උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**07. කායික සුදුසුකම්**-සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**08.වෙනත් සුදුසුකම්-**

(i) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කර ඇති දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(iii ) අදාළ තනතුරුවල වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක 10 උපයාගෙන තිබීම.

( iv) පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

09. බඳවා ගැනීමේ ක්‍රමය -

අයදුම්කරුවන් ඉහත පුරප්පාඩු අතුරින් යම් මාධ්‍යයක පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන්නේ නම් එම මාධ්‍යය පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය.

10. ලිඛිත පරීක්ෂණය හා යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය විසින් දන්වන දිනයකදී 2023 කොළඹදී පවත්වනු ලබන අතර ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම සමත් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයෙන් හා යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණය යන දෙකෙන්ම ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව පළමුව සිතාසි බෙදන්නා හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා තනතුරටත්,ඉන් පසුව අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුරටත් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

11. ලිඛිත පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ක්‍රමය -

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ලංකාවේ දැනට ක්‍රියාත්මක වන අධිකරණ පිළිබඳ අවබෝධය<br>විනිශ්වය ශාලාවක සම්ප්‍රදායන් හා ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය<br>අධිකරණ අමාත්‍යාංශය සතු කාර්ය භාරය පිළිබඳ අවබෝධය | කාලය පැය 1 (මුළු ලකුණු 100)<br>බහුවරණ හා ව්‍යුහගත ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. | ලකුණු 40 |

12.යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය-අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ලකුණු ලබා දෙනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ. |
| අතිරේක පළපුරුද්ද | 50 | |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය | 05 | |
| මුළු ලකුණු | 100 | |

13. ඉල්ලුම් පත්‍රය සෙ.මී.21-29 ප්‍රමාණයේ A4 කඩදාසි වල සකස් කළ යුතු අතර, 01-11 දක්වා ශීර්ෂ ඉල්ලුම් පත්‍රයේ පළමු වන පිටුවේද 12 සිට ඉතිරිය දෙවන පිටුවටද වන පරිදි එම ඉල්ලුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ඊට අදාළ තොරතුරු තම අත්අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත් එසේ නොවුන හොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි.ඉල්ලුම් පත මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පතට අනුව සැකසිය යුතුය.ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

**සැලකිය යුතුයි -**

ඉල්ලුම් අවස්ථාවකදි ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍රය ගැන සලකා බලනු නොලැබේ.

**14.** විභාග ගාස්තු -

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තු ලෙස රු.1500/- මුදලක් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ නමට වන සේ ගිණුම් අංක 176100199025184 ගිණුමට බැර කළ යුතු වේ. අදාල කුවිතාන්සියේ මුල් පිටපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ අමුණා එවිය යුතුය.

15. ආදර්ශ අයදුම්පත්‍රයෙහි 17 ශිර්ෂය අනිවාර්යෙන් සම්පූර්ණ කල යුතු අතර https://www.moj.gov.lk/carees/recruitment/guidline.pdf සබැදියෙහි සඳහන් මාර්ගෝපදේශය අනුව, https://justicemin.lk/recruitment/apply.php සබැඳිය වෙත පිවිස අදාල තොරතුරු ඇතුලත් කළ යුතු ය. ඔබ කුමන මාධ්‍යයන් විභාගය සඳහා පෙනී සිටියද මෙම තොරතුරු ඉංග්‍රිසි අකුරින් සම්පූර්ණ කල යුතුය. **එහි මුද්‍රිත පිටපතක් අයදුම්පතෙහි 17 වන ශිර්ෂය යටතේ අලවා /අමුණා එවිය යුතුය.මෙම කොටස සම්පූර්ණ නොමැති අයදුම්පත් අසම්පූර්ණ අයදුම්පත් ලෙස සලකනු ලැබේ.**

16. අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන තම ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතු ය.

17 **සියළුම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කල යුතුය. අයදුම්පත් ඉදිරිපත් කිරීමේදි අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ඇතුළත් අධ්‍යාපන හා පළපුරුද්දට අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් යොමු කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කටයුතු කලයුතු වේ.**

**18.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

**ලේකම් (වැ.බ)**
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය